## සබරගමු පළාත් අධ්‍යාපනය දෙපාර්තමේන්තුව

**1 ශ්‍රේණිය (ජූලි 3 සතිය)**

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

සැකසුම-කේ.ඩබ්ලිව්.එස්.දර්ශිකා විමලරත්න මෙනවිය,කෑ/දෙහි/ශ්‍රී සීලානන්ද මහා විද්‍යාලය,බුලත්කොහුපිටිය

## <u>ලස්සන මාළුවෙක් හදමු.</u>

කාර්ඩ්බෝර්ඩ් එකකින් ටිකක් ලොකු රවුමක් කපා ගන්න.

කැමති පාටකින් A4

පාට / ප්ලැටිග්නම්

නූල්

* ඔයාලා කපා ගත්ත කාර්ඩ්බෝර්ඩ් රවුමේ දෙපැත්තම පාට කොළයක් අලවා ගන්න.

* දැන් රවුමේ කැමති තැනකින් මාළුවාගේ කට ඇස් රවුමේ දෙපැත්තම ඇඳගන්න.

* දැන් ඔයාලා කැමති පාට කොළ දෙකක් අරගෙන zig zag ආකාරයට නමාගන්න.(වැඩිහිටියෙක් මේ ආකාරයට කොළය නමන අයුරු දරුවාට පෙන්වා දෙන්න.)

* දැන් ඒ කොළ දෙක මාළුවාගේ වරල් විදිහට රවුමේ දෙපැත්තෙම මැදින් අලවා ගන්න.

* මාළුවාගේ පිටුපස වරලත් කොළේකින් වරලක හැඩයට කපාගෙන අලවා ගන්න.

* දැන් මේ ලස්සන මාළුවා නූලකින් එල්ලලා බලන්න.පීනන ආකාරය ලස්සනයි නේද?

